පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.11 පැය 1850 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/710/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## පොලිස් නිලධාරීන්ගේ යහපත් රාජකාරී ඇගයීම සඳහා ත්‍යාග මුදල් ප්‍රදානය කිරීම.

කොළඹ උතුර, කොළඹ මධ්‍යම සහ කොළඹ දකුණ යන කොට්ඨාසයන්හි අපරාධ විසඳීම සඳහා සුවිශේෂී දායකත්වයක් දක්වන ලද නිලධාරීන් වෙනුවෙන් ත්‍යාග මුදල් පිරිනැමීමේ උත්සවයක් බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති උපීත් ලියනගේ මහතාගේ සහභාගිත්වයෙන් 2025 අප්‍රේල් මස 11 වන අද දින උදෑසන කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

කොළඹ උතුර, කොළඹ මධ්‍යම සහ කොළඹ දකුණ යන කොට්ඨාසයන්හි පොලිස් ස්ථාන 27 කට අනුයුක්තව රාජකාරි කරනු ලබන නිලධරයන් වෙනුවෙන් පොලිස්පති ත්‍යාග අරමුදලෙන් රුපියල් 19,500,000/= ක මුදලක් වෙන් කර ඇති අතර 2025.04.11 වන අද දින නිලධරයින් 74 දෙනෙකු සඳහා සංකේතාත්මකව ත්‍යාග මුදල් පිරිනමන ලදි.

මෙම ත්‍යාග මුදල් සඳහා පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන්, පොලිස් සැරයන්, කාන්තා පොලිස් සැරයන්, පොලිස් කොස්තාපල්වරුන්, පොලිස් කොස්තාපල්වරියන්, පොලිස් සැරයන් රියදුරු සහ පොලිස් කොස්තාපල් රියදුරු නිලධාරීන් සුදුසුකම් ලබා ඇත.

මෙම අවස්ථාව සඳහා කොළඹ මධ්‍යම කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සුගත් ගලගමගේ මහතා, කොළඹ උතුර කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික සමරපාල මහතා, කොළඹ දකුණ කොට්ඨාසයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලූෂන් සූරිය බණ්ඩාර මහතා ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්





















**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**